# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

④

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 11 ශ්‍රේණිය
## ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන

1. i. මූල්‍ය ප්‍රකාශන යනු මොනවාද?
   ii. ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන 2 ක් ඇත. ඒවා නම් කරන්න.
   iii. ලාභ හෝ අලාභ ප්‍රකාශනය යනු කුමක්ද?
   iv. ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කිරීමේ මූලික අරමුණ කුමක්ද?
   v. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනු කුමක්ද?
   vi. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේ මූලික අරමුණ කුමක්ද?

2. i. දළ ලාභය යනු කුමක්ද?
   ii. දළ ලාභය = ............................ - ............................
   iii. විකුණුම් ආදායම = ............................ + ............................
   iv. මුළු ගැනුම් = ............................ + ............................

3. පහත සඳහන් තොරතුරු උපයෝගි කර ගනිමින් මිලට ගත් තොගයේ මුළු පිරිවැය ගණනය කරන්න.

| | රු. |
|---|---|
| • ගැනුම් | 80 000 |
| • පැටවුම් කුලී | 10 000 |
| • ගෙනඒමේ කුලී | 5 000 |

4.

| | රු. |
|---|---|
| ආරම්භක තොගය | 60 000 |
| ගැනුම් | 200 000 |
| ගෙනඒමේ කුලී | 5 000 |
| පැටවීමේ කුලී | 6 000 |
| අවසන් තොගය | 40 000 |

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය
ii. විකුණුම් පිරිවැය



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

5. පහත තොරතුරු සැලකිල්ලට ගෙන දල ලාභය ගණනය කරන්න.

| | (රු.) |
|---|---|
| ගැනුම් | 50 000 |
| විකුණුම් | 100 000 |
| ආරම්භක තොගය | 10 000 |
| අවසන් තොගය | 6 000 |
| ගෙන ඒමේ කුලී | 3 000 |
| පැටවීමේ කුලී | 2 000 |

6. පහත තොරතුරු සැලකිල්ලට ගෙන දල ලාභය ගණනය කරන්න.

| | (රු.) |
|---|---|
| ආරම්භක තොග | 30 000 |
| අවසන් තොග | 10 000 |
| අත්පිට විකුණුම් | 30 000 |
| ණයට විකුණුම් | 20 000 |
| අත්පිට ගැනුම් | 8 000 |
| ණයට ගැනුම් | 12 000 |
| පැටවීමේ කුලී | 1 000 |
| ගෙන ඒමේ කුලී | 500 |

7.

| | (රු.) |
|---|---|
| ගෙන ඒමේ කුලී | 5 000 |
| පැටවීමේ කුලී | 4 000 |
| ගැනුම් | 20 000 |
| විකුණුම් | 60 000 |
| ආරම්භක තොගය | 10 000 |
| අවසන් තොගය | 4 000 |

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන දළ ලාභය ගණනය කරන්න.

8. පහත තොරතුරු සැලකිල්ලට ගෙන වෙනත් ආදායම්වල එකතුව ගණනය කරන්න.

| | (රු.) |
|---|---|
| ලද වට්ටම් | 4 000 |
| කඩ කුලී ආදායම් | 2 000 |
| පොලී ආදායම් | 3 000 |
| ලාභාංශ ආදායම් | 6 000 |
| ආයෝජන ආදායම් | 5 000 |
| ලද කොමිස් | 1 000 |

9. 2021 වර්ෂයේ හඳුනාගත් වියදම් කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ගෙවල් කුලී | ලිපිද්‍රව්‍ය |
| විදුලිය | කඩකුලී වියදම් |
| බොල්ණය | කාර්යාල වියදම් |
| පොලී වියදම් | ප්‍රචාරණය |
| බැංකු ගාස්තු | සේවක ප්‍රවාහනය |
| මුදල් වංචා අලාභ | ගෙනයාමේ කුලී |
| යන්ත්‍ර ක්ෂය | වෙළෙඳ සේවක වේතන |
| වැටුප් | ගිනි හානි |
| ගමන් වියදම් | ලීබඩු ක්ෂය |
| මෝටර් රථ ක්ෂය | ගොඩනැගිලි ක්ෂය |

ඔබ විසින් ඉහත සඳහන් කර ඇති වියදම් පහත දැක්වෙන වගුවට අදාළ ශීර්ෂ යටතේ වෙන් කරන්න.

| බෙදාහැරීමේ වියදම් | පරිපාලන වියදම් | වෙනත් වියදම් | මූල්‍ය වියදම් |
|---|---|---|---|
| | | | |

10. පහත තොරතුරු සැලකිල්ලට ගෙන ශුද්ධ ලාභය ගණනය කරන්න.

| | රු. | | රු. |
|---|---|---|---|
| දළ ලාභය | 50 000 | වෙළෙඳ සේවක වැටුප් | 6 000 |
| ලද වට්ටම් | 4 000 | බැංකු ණය පොළී | 4 000 |
| රක්ෂණ ගාස්තු | 3 000 | ගිනි හානි අලාභ | 3 000 |
| පරිපාලන වේතන | 2 000 | ප්‍රචාරණය | 1 000 |
| පොළී ආදායම | 2 500 | ගෙනයාමේ කුලී | 2 000 |
| | | කොමිස් ආදායම් | 6 000 |

11. සිතාරගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුමේ නම | හර රු. | බැර රු. |
|---|---|---|
| 2020.01.01 තොගය | 18 000 | |
| ගැනුම් | 60 000 | |
| ගෙනඒමේ කුලී | 3 000 | |
| පැටවීමේ කුලී | 4 000 | |
| විකුණුම් | | 150 000 |
| ඉඩම් | 180 000 | |
| යන්ත්‍ර | 90 000 | |
| සේවක වැටුප් | 10 000 | |
| ප්‍රචාරණය | 5 000 | |
| පොළී ආදායම | | 15 000 |
| පොළී වියදම් | 6 000 | |
| ණයගැතියෝ | 12 000 | |
| ණයහිමියෝ | | 20 000 |
| බොල්ණය | 1 000 | |
| රක්ෂණය | 2 000 | |
| ලිපිද්‍රව්‍ය | 4 000 | |
| දුන් වට්ටම් | 2 000 | |
| ස්ථාවර තැම්පතු | 130 000 | |
| බැංකු ණය | | 200 000 |
| ප්‍රාග්ධනය | | 155 000 |
| මුදල් වංචා අලාභ | 8 000 | |
| බැංකු ගාස්තු | 5 000 | |
| | 540 000 | 540 000 |

සටහන :- මිලට ගත් භාණ්ඩ තොග සියල්ල විකිණී ඇත.

ඉහත තොරතුරු සැලකිල්ලට ගෙන ලාභ හෝ අලාභ ප්‍රකාශනය පිළියෙල කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

12. ව්‍යාපාරයක ජංගම නොවන වත්කම් කිහිපයක විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ඉඩම් | 400 000 |
| ගොඩනැගිලි | 200 000 |
| යන්ත්‍රසූත්‍ර | 300 000 |
| මෝටර්රථ | 400 000 |
| ලීබඩු හා උපකරණ | 150 000 |
| ආයෝජන | 100 000 |
| ස්ථාවර තැම්පතු | 50 000 |

වර්ෂයේ අවසාන දිනට ක්ෂය වෙන්කිරීම්

| | |
|---|---|
| ගොඩනැගිලි | 30 000 |
| යන්ත්‍රසූත්‍ර | 60 000 |
| මෝටර් රථ | 80 000 |
| ලීබඩු හා උපකරණ | 15 000 |

පිළිතුරු සැපයීමේදී පහත ආකෘතිය භාවිතා කර ජංගම නොවන වත්කම්වල ධාරණ අගය ගණනය කරන්න.

| ජංගම නොවන වත්කම් | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) | ධාරණ අගය (රු.) |
|---|---|---|---|
| | | | |

13. පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගෙන ජංගම වත්කම් වටිනාකම ගණනය කරන්න.

| | රු. |
|---|---|
| තොගය | 20 000 |
| ණයගැතියෝ | 10 000 |
| බැංකු මුදල් | 13 000 |
| අතැති මුදල් | 8 000 |
| ලැබිය යුතු ආදායම් | 40 000 |

14. නිමල්ගේ ව්‍යාපාරයේ 2021.12.31දිනට වත්කම්වලට අදාළ තොරතුරු පහත දී ඇත.

| | රු. |
|---|---|
| අතැති මුදල් | 15 000 |
| බැංකු මුදල් | 13 000 |
| ගොඩනැගිලි | 100 000 |
| ඉඩම් | 300 000 |
| ලැබියයුතු ආදායම් | 4 000 |
| ණයගැතියෝ | 18 000 |
| අවසන් තොගය | 12 000 |
| ආයෝජන | 50 000 |
| ලීබඩු | 60 000 |
| <u>2021.12.31 ක්ෂය වෙන් කිරීම</u> | |
| ගොඩනැගිලි | 40 000 |
| ලීබඩු | 10 000 |

අවශ්‍ය වන්නේ,
ජංගම නොවන වත්කම්, ජංගම වත්කම් පැහැදිලිව වර්ග කරමින් මුළු වත්කම් වටිනාකම ගණනය කරන්න.

සටහන:- පිළිතුරු සැපයීමේදී පහත වගුව භාවිතා කරන්න.

| ජංගම නොවන වත්කම් | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) | ධාරණ අගය (රු.) |
|---|---|---|---|
| | | | |
| | | | |
| ජංගම වත්කම් | | | |
| මුළු වත්කම් | | | |

15. පහත තොරතුරු භාවිතා කර දී ඇති වගුවේ විස්තර ඇතුළත් කර 2021.12.31 දිනට අවසන් හිමිකම ගණනය කරන්න.

| | | |
|---|---|---|
| 2021.01.01 ප්‍රාග්ධනය | = | 100 000 |
| ගැනිලි | = | 20 000 |
| ශුද්ධලාභය | = | 45 000 |

| | | |
|---|---|---|
| හිමිකම<br>2021.01.01 ප්‍රාග්ධනය<br>එකතුකළා :- ශුද්ධලාභය<br><br>අඩුකළා :- ගැනිලි<br>2021.12.31 හිමිකම් | | ..............................<br>..............................<br><br>(..............................)<br>.................................. |

16. පහත තොරතුරු සැලකිල්ලට ගෙන ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් ගණනය කරන්න.

| | රු. |
|---|---|
| ණයහිමියෝ | 30 000 |
| උපචිත බැංකු පොළී | 4 000 |
| ගෙවිය යුතු විදුලිය | 3 000 |
| බැංකු ණය | 200 000 |
| බැංකු අයිරාව | 10 000 |
| උපචිත රක්ෂණය | 6 000 |
| කල්බදු ණය (ලීසිං) | 100 000 |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

17. බිමල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට පැවති වත්කම්, වගකීම් හා හිමිකම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ගැනිලි | 24 000 |
| 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය | 409 000 |
| ණයහිමියෝ | 51 000 |
| ගෙවියයුතු වැටුප් | 4 000 |
| ලැබිය යුතු පොළී ආදායම් | 6 000 |
| 2021.01.01 ප්‍රාග්ධනය | 1 000 000 |
| තොගය | 220 000 |
| ණයගැතියෝ | 80 000 |
| බැංකු මුදල් | 65 000 |
| අතැති මුදල් | 34 000 |
| බැංකු ණය | 400 000 |
| ඉඩම් | 400 000 |
| ගොඩනැගිලි | 500 000 |
| මෝටර්රථ | 400 000 |
| ලීබඩු උපකරණ | 150 000 |
| ස්ථාවර තැම්පතු | 100 000 |
| 2021.12.31 දිනට ක්ෂය වෙන් කිරීම | |
| ගොඩනැගිලි | 20 000 |
| මෝටර්රථ | 80 000 |
| ලීබඩු හා උපකරණ | 15 000 |

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගෙන 2021.12.31 දිනට බිමල්ගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

18. සුනිමල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2021.01.01 ප්‍රාග්ධනය | | 200 000 |
| බැංකු ණය | | 100 000 |
| ආයෝජන | 100 000 | |
| ආරම්භක තොගය | 20 000 | |
| ගැනුම් | 200 000 | |
| විකුණුම් | | 500 000 |
| ගෙනැප්මේ කුලී | 4 000 | |
| පැටවීමේ/ බෑමේ කුලී | 3 000 | |
| ණයගැතියෝ | 20 000 | |
| ණයහිමියෝ | | 30 000 |
| ඉඩම් (පිරිවැය) | 200 000 | |
| ගොඩනැගිලි(පිරිවැය) | 100 000 | |
| මෝටර් රථ(පිරිවැය) | 50 000 | |
| 2021.12.31 දිනට ක්ෂය වෙන් කිරීම | | |
| ගොඩනැගිලි | | 50 000 |
| මෝටර්රථ | | 30 000 |
| උපචිත විදුලිය | | 6 000 |
| ලැබිය යුතු කොමිස් ආදායම් | 4 000 | |
| අතැති මුදල් | 221 000 | |
| ගැනිලි | 10 000 | |

| | | |
|---|---|---|
| බැංකු අයිරාව | | 15 000 |
| සේවක වැටුප් | 13 000 | |
| මුදල් වංචා අලාභ | 3 000 | |
| පොළී ආදායම | | 40 000 |
| ලිපිද්‍රව්‍ය | 4 000 | |
| ප්‍රචාරණය | 8 000 | |
| ගමන් වියදම් | 6 000 | |
| බැංකු ගාස්තු | 5 000 | |
| | 971 000 | 971 000 |

සටහන :- මිලට ගත් තොග සියල්ල විකිණී ඇත.

අවශ්‍ය වන්නේ,

1) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

19. 2021.01.01 දින ආරම්භ කළ විද්‍යානී ව්‍යාපාරයේ 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

ආදායම් ප්‍රකාශනයේ උපුටා ගැනීම්.

| | රු. | | රු. |
|---|---|---|---|
| ලද වට්ටම් | 500 | ප්‍රචාරණය | 1 400 |
| විකුණුම් | 110 000 | ගොඩනැගිලි කුලී | 4 500 |
| ගැනුම් | 80 000 | රක්ෂණය | 2 800 |
| ණය පොළිය | 1 900 | විදුලිය | 800 |
| මෝටර් රථයේ ක්ෂය | 1 600 | සේවක වැටුප් | 3 900 |
| | | පුණ්‍යායතනයකට කළ පරිත්‍යාග | 100 |

2021.12.31 දිනට වත්කම් හා වගකීම් ශේෂ පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| තොගය | 10 000 | වෙළෙඳ ණයගැතියෝ | 8 000 |
| මෝටර් රථයේ(පිරිවැය) | 40 000 | වෙළෙඳ ණයහිමියෝ | 6 400 |
| මුදල් | 2 000 | බැංකු ණය | 10 000 |
| | | උපචිත ගොඩනැගිලි කුලී | 600 |

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. මෙම ව්‍යාපාරයේ 2021.12.31 න් අවසන් වර්ෂයේ දළ ලාභය කොපමණද?

(1) රු. 10 000
(2) රු. 20 000
(3) රු. 30 000
(4) රු. 40 000

2. පරිපාලන වියදම්වල එකතුව කොපමණද?

(1) රු. 10 000
(2) රු. 11 000
(3) රු. 12 000
(4) රු. 13 000



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

3. වර්ෂය තුළ මුදලින් ගෙවූ ගොඩනැගිලි කුලිය කොපමණද?

(1) රු. 2 900
(2) රු. 3 900
(3) රු. 4 000
(4) රු. 4 500

4. වර්ෂයේ බෙදාහැරීම් වියදම්වල එකතුව කොපමණද?

(1) රු. 1 400
(2) රු. 1 600
(3) රු. 3 000
(4) රු. 4 000

5. මූල්‍ය හා වෙනත් වියදම්වල එකතුව කොපමණද?

(1) රු. 100
(2) රු. 900
(3) රු. 1 900
(4) රු. 2 000

6. 2021.12.31න් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය කොපමණද?

(1) රු. 23 000
(2) රු. 23 500
(3) රු. 30 500
(4) රු. 40 000

7. 2021.12.31 දිනට මුළු වත්කම්වල අගය කොපමණද?

(1) රු. 40 000
(2) රු. 50 000
(3) රු. 60 000
(4) රු. 70 000

8. 2021.12.31 දිනට මුළු වගකීම්වල අගය කොපමණද?

(1) රු. 15 000
(2) රු. 16 000
(3) රු. 17 000
(4) රු. 18 000

9. 2021.12.31 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම කොපමණද?

1.රු. 40 000
2.රු. 41 000
3.රු. 42 000
4.රු. 43 000

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

20. බටුවැව ව්‍යාපාරිකයෝ 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර(රු.) | බැර(රු.) |
|---|---|---|
| මුදල් | 25 000 | |
| 2020.04.01 තොගය | 25 000 | |
| ගැනුම් | 195 000 | |
| ගෙනඒමේ කුලී | 3 000 | |
| වෙළෙඳ ණයගැතියෝ | 28 000 | |
| ගොඩනැගිලි කුලිය | 6 000 | |
| සේවක වැටුප් | 18 000 | |
| මූල්‍ය වියදම් | 3 000 | |
| දුන් වට්ටම් | 1 000 | |
| විකුණුම් වියදම් | 8 000 | |
| ලද වට්ටම් | | 2 000 |
| විකුණුම් | | 300 000 |
| ප්‍රාග්ධනය | | 10 000 |
| | 312 000 | 312 000 |

අමතර තොරතුරු

- ණයගැතියන්ගෙන් රු. 3 000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතුය.
- 2020.12.31 දිනට ඉතිරි තොග පිරිවැය රු. 35 000 කි.
- වර්ෂයට අදාළ ගොඩනැගිලි කුලිය රු. 9 000 කි.

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 2020.12.31 න් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය කොපමණද?

   1. රු. 178 000
   2. රු. 188 000
   3. රු. 198 000
   4. රු. 223 000

2. 2020.12.31 න් අවසන් වර්ෂයේ දළ ලාභය කොපමණද?

   1. රු. 110 000
   2. රු. 111 000
   3. රු. 112 000
   4. රු. 113 000

3. ව්‍යාපාරය විසින් මුදලින් ගෙවන ලද ගොඩනැගිලි කුලිය කොපමණද?

   1. රු.6 000
   2. රු. 7 000
   3. රු.8 000
   4. රු. 9 000

4. 2020.12.31 දිනට මූල්‍ය තත්ත්වයේ දැක්වෙන ණයගැතියන්ගේ අගය කොපමණද?

   1. රු.25 000
   2. රු. 26 000
   3. රු.27 000
   4. රු. 28 000

5. 2012.12.31 න් අවසන් වර්ෂයේ ශුද්ධලාභය කොපමණද?

   1. රු.70 000
   2. රු. 71 000
   3. රු.72 000
   4. රු. 73 000

6. 2020.12.31 දිනට අයිතිකරුගේ හිමිකම කොපමණද?

1. රු.72 000  
2. රු. 82 000  
3. රු.92 000  
4. රු. 102 000

7. 2020.12.31 දිනට ව්‍යාපාරයේ මුළු වත්කම් කොපමණද?

1. රු.80 000  
2. රු. 85 000  
3. රු.88 000  
4. රු. 113 000

21. රංගම ස්ටෝර්ස් හි ආධුනික ගිණුම් ලිපිකරුවෙකු වූ වරුණ 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන පහත දැක්වේ.

2020.12.31 න් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| විකුණුම් | | 430 000 |
| ලද වට්ටම් | | 5 000 |
| | | 435 000 |
| <u>අඩුකළා: වියදම්</u> | | |
| ගැනුම් | 215 000 | |
| ගෙනැප්මේ කුලී | 15 000 | |
| විකුණුම් කොමිස් | 10 000 | |
| ගොඩනැගිලි කුලී | 18 000 | |
| සේවක වැටුප් | 24 000 | |
| ණයපොළී | 6 000 | |
| විදුලිබිල් | 13 000 | |
| දුන් වට්ටම් | 4 000 | (305 000) |
| ශුද්ධ ලාභය | | 130 000 |

2020.12.31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | |
|---|---|
| මෝටර් රථය | 400 000 |
| ණයගැතියෝ | 40 000 |
| මුදල් | 20 000 |
| තොගය | 25 000 |
| | 485 000 |
| ප්‍රාග්ධනය | 165 000 |
| ශුද්ධලාභය | 130 000 |
| බැංකු ණය | 160 000 |
| ණයහිමියෝ | 24 000 |
| උපචිත ණය පොළිය | 6 000 |
| | 485 000 |

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) 2020.12.31 න් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය කොපමණද?

1. රු. 200 000  
2. රු. 230 000  
3. රු. 205 000  
4. රු. 255 000

2) 2020.12.31 න් අවසන් වර්ෂයේ දළ ලාභය කොපමණද?

1. රු. 200 000  
2. රු. 205 000  
3. රු. 215 000  
4. රු. 225 000

3) 2020.12.31 න් අවසන් වර්ෂයේ නිවැරදි ශුද්ධ ලාභය කොපමණද?

1. රු. 155 000  
2. රු. 165 000  
3. රු. 175 000  
4. රු. 185 000

4) මෙම ව්‍යාපාරයේ මෝටර් රථයද 5% ක් වාර්ෂිකව පිරිවැය මත ක්ෂය කරන්නේ නම් නිවැරදි ශුද්ධ ලාභය කොපමණ විය යුතුද?

1. රු. 115 000  
2. රු. 135 000  
3. රු. 145 000  
4. රු. 155 000

5) මෙම ව්‍යාපාරය මුදලින් ගෙවන ලද බැංකු ණය පොළිය කොපමණද?

1. කිසිවක් නැත. 2. රු. 12 000
3. රු. 6 000 4. රු. 18 000

6) 2020.12.31 දිනට ජංගම වත්කම් කොපමණද?

1. රු. 20 000 2. රු. 25 000
3. රු. 60 000 4. රු. 85 000

7) 2020.12.31 දිනට ජංගම වගකීම් කොපමණද?

1. රු.6 000 2. රු. 24 000
3. රු.30 000 4. රු. 90 000

8) 2020.12.31 දිනට මුළු හිමිකම කොපමණද? (මෝටර් රථ 5% ක්ෂය කිරීමෙන් පසුව)

1. රු. 120 000 2. රු. 165 000
3. රු. 285 000 4. රු. 300 000

22. ව්‍යාපාරයක භාණ්ඩ නිෂ්පාදනය කිරීමට 2020.01.01 දින මිලටගත් යන්ත්‍රයේ තොරතුරු

| | |
|---|---|
| යන්ත්‍රයේ පිරිවැය | රු. 780 000 |
| සවිකිරීමේ වියදම් | රු. 30 000 |
| යන්ත්‍රයේ සුන්බුන් අගය | රු. 60 000 |
| ඵලදායි ජීව කාලය | වර්ෂ 10 කි. |

I. මෙම යන්ත්‍රයේ පිරිවැය කොපමණද?

1. රු. 750 000 2. රු. 780 000
3. රු. 810 000 4. රු. 870 000

II. මෙම යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය කොපමණද?

1. රු. 75 000 2. රු. 78 000
3. රු. 81 000 4. රු. 87 000

III. 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙම යන්ත්‍රයේ ධාරණ අගයලෙස දැක්වෙනුයේ,

1. රු. 675 000 2. රු. 705 000
3. රු. 735 000 4. රු. 795 000

23. අරලිය ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව උපුටා ගත් තොරතුරු

| | හර (රු.) | බැර(රු.) |
|---|---|---|
| 2020.01.01 දිනට තොග | 33 000 | |
| විකුණුම් | | 224 000 |
| ගැනුම් | 157 000 | |
| ගොඩනැගිලි කුලී | 9 000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 450 000 | |
| 2020.01.01 ගොඩනැගිලි සමුච්චිත ක්ෂය | | 110 000 |
| ණය ගැතියෝ | 28 000 | |
| බැංකු අයිරාව | | 20 000 |
| ණය හිමියෝ | | 35 000 |
| විදුලි වියදම | 10 000 | |
| විකුණුම් කොමිස් | 7 000 | |
| අතැති මුදල | 13 000 | |
| දුන් වට්ටම් | 2 000 | |
| ලද වට්ටම් | | 6 000 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | | 314 000 |
| | 709 000 | 709 000 |

අමතර තොරතුරු

- 2020.12.31 දිනට ඉතිරි තොග පිරිවැය රු.36,000කි.
- ගොඩනැගිලි වාර්ෂිකව පිරිවැය මත 10%ක් ක්ෂය කරනු ලැබේ.
- ණයගැතියන්ගෙන් රු.3,000ක් බොල් ණය කපා හැරිය යුතුය.
- උපචිත විදුලිය වියදම රු.2,000කි.

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 2020.12.31න් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය කොපමණද?

1) රු.144,000 2) රු.150,000
3) රු.154,000 4) රු.163,000

2. වර්ෂයේ දළ ලාභය කොපමණද?

1) රු.40,000 2) රු.50,000
3) රු.61,000 4) රු.70,000

3. මෙහි අඩංගු පරිපාලන හා බෙදා හැරීම් වියදමක් පිළිවෙලින් දැක්වෙනුයේ,

1) විකුණුම් කොමිස් හා දුන්වට්ටම් 2) විදුලිය හා විකුණුම් කොමිස්
3) විකුණුම් කොමිස් හා බොල්ණය 4) දුන් වට්ටම් හා බොල් ණය

4. මෙම තොරතුරු අනුව ගොඩනැගිලිවල 2020.12.31 දිනට ධාරණ අගය කොපමණද?

1) රු.295,000 2) රු.300,000
3) රු.350,000 4) රු.450,000

5. 2020.12.31 දින දින ජංගම වත්කම්වල අගය කොපමණද?

1) රු.64,000 2) රු.74,000
3) රු.80,000 4) රු.94,000

6. වර්ෂයේ ශුද්ධ ලාභය/ අලාභය කොපමණද?

1) ලාභය රු.10,000 2) ලාභය රු.2,000
3) අලාභය රු.2,000 4) අලාභය රු.4,000

7. 2020.12.31 දිනට හිමිකමේ ශේෂය කොපමණද?

1) රු.310,000 2) රු.312,000
3) රු.314,000 4) රු.320,000

වාණිජ්‍ය හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

24. දැදුරු ඔය ට්‍රේඩින් පහත තොරතුරු සපයා ඇත.

| 2020.12.31 දිනට ශේෂ | රු. |
|---|---|
| ගොඩනැගිලි කුලී ගිණුම | 24,000 |
| මෝටර් රථ ගිණුම (පිරිවැය) | 100,000 |
| 10% ස්ථාවර තැන්පතුව | 200,000 |
| විකුණුම් | 500,000 |
| විකුණුම් පිරිවැය | 280,000 |
| 2020.01.01 දිනට මෝටර් රථ සමුච්චිත ක්ෂය | රු.4,000 |

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. වාර්ෂික ගොඩනැගිලි කුලිය රු.30,000ක් නම් උපචිත ගොඩනැගිලි කුලිය ගිණුම්ගත කරන්නේ කෙසේද?

1) ගොඩනැගිලි කුලී ගිණුම හර රු.6,000
   උපචිත ගොඩනැගිලි කුලී ගිණුම බැර රු.6,000
2) උපචිත ගොඩනැගිලි කුලී ගිණුම හර රු.6,000
   ගොඩනැගිලි කුලී ගිණුම බැර රු.6,000
3) ගොඩනැගිලි කුලී ගිණුම හර රු.24,000
   උපචිත ගොඩනැගිලි කුලී ගිණුම බැර රු.24,000
4) ගොඩනැගිලි කුලී ගිණුම හර රු.30,000
   උපචිත ගොඩනැගිලි කුලී ගිණුම බැර රු.30,000

ii. මෝටර් රථ වාර්ෂිකව පිරිවැය මත 5% බැගින් ක්ෂය කරනු ලබන්නේ නම් 2020.12.31 දිනට මොටර් රථවල ධාරණ අගය කොපමණද?

1) රු.91,000 2) රු.95,000
3) රු.98,000 4) රු.100,000

iii. ස්ථාවර තැන්පතුව සඳහා අදාල පොළිය තවම ලැබී නැත. එම පොළිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන ශීර්ෂය කුමක්ද?

1) ආදායම් රු.20,000
2) වියදම් රු.20,000
3) වගකීම් රු.20,000
4) වත්කම් රු.20,000

iv. දී ඇති තොරතුරු ඇසුරින් 2020.12.31න් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය කොපමණද?

1) රු.190,000 2) රු.195,000
3) රු.200,000 4) රු.205,000

25. පහත සඳහන් අයිතම වත්කම්, වගකීම් හා හිමිකම්, ආදායම්, වියදම් ලෙස වර්ගීකරණය කරන්න.

| | අයිතමය | වර්ගීකරණය කිරීම |
|---|---|---|
| I. | ලැබිය යුතු පොළිය | ............................ |
| II. | ගෙවිය යුතු විදුලිය | ............................ |
| III. | අමතර ප්‍රාග්ධනය | ............................ |
| IV. | විකුණුම් | ............................ |
| V. | බොල් ණය | ............................ |
| VI. | ඉදිරියට ගෙවූ කුලී | ............................ |
| VII. | කලින් ලද ආදායම් | ............................ |
| VIII. | ගැනිලි | ............................ |
| IX. | ලද කොමිස් | ............................ |
| X. | දුන් පරිත්‍යාග | ............................ |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

26. ගිනිකරාව වෙළෙන්දෝ ව්‍යාපාරයෙන් පහත තොරතුරු උපුටාගෙන ඇත. මෙම ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2020.12.31න් අවසන් වේ.

1) ගොඩනැගිලි කුලිය මාසිකව රු.12,000ක් වේ. දැනට මාස 10ක ගොඩනැගිලි කුලිය පමණක් ගෙවා ඇත.

2) විදුලි බිල්පත් ගෙවා ඇති ප්‍රමාණයේ වටිනාකම රු.36,000කි. 2020 දෙසැම්බර් මාසයේ රු.4,000ක විදුලි බිල් තවම ගෙවා නොමැත.

3) 2020.09.01 දින 12%ක පොළී අනුපාතයක් යටතේ ලබාගත් බැංකු ණය රු.120,000කි. මේ සඳහා අදාළ පොළිය 2020.12.31 දින වන විටත් ගෙවා නොතිබිණි.

4) 2020.12.31 දිනට ගෙවිය යුතු දුරකථන බිල්පත්වල එකතුව රු.9,000කි.

5) රු.4,000 වරිපනම් ගාස්තුවක් ගෙවා නොමැත.
අවශ්‍ය වන්නේ,

1) වියදම් ගිණුමට අදාළ පහත වගුව සම්පූර්ණ කරන්න.

| වියදම් ගිණුම | මුදලින් ගෙවීම (රු.) | උපචිත වියදම (රු.) | 2020.12.31න් අවසන් වර්ෂයේ වියදම (රු.) |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

2) ඉහත ගනුදෙනු අනුව උපචිත වියදම ගිණුම්ගත කිරීමේ ජ'නල් සටහන පහත වගුවේ ඇතුළත් කරන්න.

| ගනුදෙනුව | හරවන ගිණුම | බැරවන ගිණුම |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

3) ආදායම් ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

| ගනුදෙනුව | ආදායම් ප්‍රකාශය | ජංගම වගකීම් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව